**නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන - 2022**
**-----------------------------------------------------**

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූළ වියදම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 මැයි 11 දින එළඹි අංක 3650 එස්ආර්අයි (සීඕඑල්) සහ 3651 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.04(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම ,අරමුණු ,අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය**

වැඩසටහනේ ප්‍රදාන ගිවිසුම අනුව, එවකට නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර සහ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය 11 පවති. ගුණාත්මකභාවය, අදාළත්වය, ප්‍රවේශය, වෘත්තීය පුහුණුව සඳහා වන පිළිගැනීම සහ ආධාරක ප්‍රතිපත්ති, පද්ධති සහ ව්‍යුහයන් වැඩිදියුණු කිරීම මගින් දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා කාර්යක්ෂම නිපුණතා අධ්‍යාපන පද්ධතියක් ගොඩනැගීම වැඩසටහනේ අරමුණු වේ.ණය ගිවිසුම අනුව, වැඩසටහනේ මුළු පිරිවැය රු.මිලියන 154,624කට සමාන එ.ජ.ඩො මිලියන 1,061.2ක් වන අතර ඉන් රු.මිලියන 28,708.23කට සමාන එ.ජ.ඩො මිලියන 200ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව සහ රු.මිලියන 13,100කට සමාන එ.ජ.ඩො මිලියන 100ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකග වූ අතර ඉතිරි මුදල වූ එ.ජ.ඩො මිලියන 761.2 ජර්මන් රජය, කොරියන් එක්සිම් බැංකුව, වෙනත් සහ ශ්‍රී ලංකා රජය මූල්‍යනය කරන ලදි. වැඩසටහන එහි කටයුතු 2014 සැප්තැම්බර් ආරම්භ කරන ලද අතර 2021 ජුනි නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, 2023 ජුනි 30 දක්වා දෙවතාවක් දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය මතය**

මාගේ වාර්තාවේ 2 වගුවේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2022 දෙසැම්බර් 31 දිනට නියෝජිතායතන 11 හි මූල්‍ය ප්‍රකාශනවල සපයා ඇති තොරතුරු සමඟ නිපුණතා අංශික සංවර්ධන වැඩසටහනේ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය සමඟ එකඟ වූ අතර වැඩසටහනේ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය ආයතන 11හි මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති තොරතුරුවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයක් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා

ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම ඒකාබද්ධ මූළු වියදම් ප්‍රකාශය පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූළු වියදම් ප්‍රකාශය ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් ඒකාබද්ධ මූළු වියදම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් ඒකාබද්ධ මූළු වියදම් ප්‍රකාශය ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය පිළිබද අදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු.මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | අනෙකුත් ප්‍රදානයන්ගෙන් සහ ව්‍යාපෘතිවලින් ලැබුණු රු. මිලියන 100.21ක මුදල ජාතික තරුණ සභාවේ යටතේ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශයේ රු. මිලියන 68.48ක් ලෙස දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, අනෙකුත් මුල්‍ය ක්‍රියාකාරකම්වල පෙන්වා ඇති රු. මිලියන 116.32ක මුදල රු. මිලියන 31.73 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 31.73 | මෙම වෙනසට හේතු වී ඇත්තේ මුදල් පදනම සඳහා මුල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වැරදි ලෙස වෙනත් සම්බන්ධිත ආයතනවලින් ලැබෙන සම්පූර්ණ ආදායම සැලකිල්ලට නොගැනීමයි. එනම් ආදායම් ලෙජරයේ සඳහන් ජර්නල් සටහන් මගින් සිදු කරන ලද ගැලපීම් සැලකිල්ලට නොගෙන අදාළ වටිනාකම ගණනය කර ඇති අතර එම මුදල මිලියන 31.73 කි. | මුල්‍ය කටයුතු ගණනය කිරීම සඳහා සියලු ආදායම් සලකා බැලීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාතික තරුණ සභාව යටතේ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශයේ දක්වා ඇති මුදල් හා මුදල්වලට සමාන දෑවල ආරම්භක හා අවසන් ශේෂයන් වැඩියෙන් සහ අඩුවෙන් දක්වා තිබුණි. | 18.40 | මෙම වෙනසට හේතු වී ඇත්තේ මුදල් පදනම සඳහා මුල්‍ය ප්‍රකාශන සැකසීමේදී අත්තිකාරම් ගිණුම්වලට ඇතුළත් කර තිබුණු රු.මිලියන 18ක වටිනාකම වැරදි ලෙස මුල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීමයි. | ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශයේ සංඛ්‍යාවලට ලබාගැනීමේදී අදාළ සියලුම අයිතම ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශයේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ පෙන්වා දී ඇති පුනරාවර්තන වියදම්වල උප එකතුව රු. මිලියන 508 ආරම්භක සහ අවසන් උපචිත ගැලපීමෙන් පසු පුනරාවර්තන වියදම් අයිතම 11ක එකතුව වූ රු. මිලියන 5.23 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 5.23 | වර්ෂයේ ආරම්භක උපචිත වියදම් රු. මිලියන 32.169 ක් වන අතර වර්ෂයේ අවසානයේ උපචිත වියදම රු. මිලියන 27.69 කි. මෙම උපචිත වියදම් දෙක අතර වෙනස රු. මිලියන 4.47 ද මුදල් පදනම අනුව ගිණුම්වලට ගැලපිය යුතුය. | වියදම් මුදල් පදනම මත නිවැරදිව දැක්විය යුතුය. |
| (ඈ) | ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශයේ ස්වයං මුල්‍ය වටිනාකම රු. මිලියන 18.87ක් ලෙස දක්වා තිබුණද, අදාළ සටහන් අංක 04 යටතේ එම අගයම රු. මිලියන 36.47ක් ලෙස දක්වා තිබුණි. | 17.6 | රු. මිලියන 18.87 නිවැරදියි. මෙම අගය නිවැරදිව මුල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇත. කෙසේවෙතත්, අදාළ සටහන අංක 04 හි වටිනාකම රු. මිලියන 36.47 කි. | සටහන් නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ජාතික ආධුනිකත්ව සහ කාර්මික - පුහුණු අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන 2023 ජුනි 20 දින දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරියේ 2022 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2023 ජුනි 23 වැනි දින ඉදිරිපත් කර තිබුණි. | නියමිත වේලාවට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3. භෞතික ප්‍රගතිය**

**3.1 වැඩසටහනේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

වියපැහැදම් සබැඳි දර්ශක 9ක් යටතේ වියපැහැදම් සබැඳි දර්ශක වගුවේ දක්වා ඇති ඉලක්ක 51න් 2022 දෙසැම්බර් 31 වන විට ඉලක්ක 48ක් සාක්ෂාත් කර ගෙන ඇත. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම්** | **විගණකගේ නිර්දේශ** |
|---|---|---|---|
| (අ) | රැකියා සම්බන්ධ පුහුණු මිලදී ගැනීමේ ආකෘතිය (ELTP) වැඩසටහන ඩීඑල්අයි 05 යටතේ 2015 දී ආරම්භ කරන ලද්දේ ඉහළ ඉල්ලුමක් ඇති කාර්මික අංශයන්හි රැකියා සඳහා අවශ්‍ය නිපුණතා සංවර්ධනය සඳහා සහය ලබා දීමේ අරමුණින් වන අතර 2022 දෙසැම්බර් 31 වන විට සිසුන් 8,000ක් බඳවා ගැනීමේ ඉලක්කය සපුරා ගන්නා ලද අතර ඒ සඳහා රු. මිලියන 343.51ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ. | | |
| | ගිවිසුම් 104ක් යටතේ පාඨමාලා හැදෑරීමට බඳවාගත් සිසුන් 8,426ක් අතරින් සිසුන් 5,863ක් පාඨමාලා සම්පූර්ණ කර තිබූ අතර පාඨමාලා අවසන් කරන ලද පිරිසෙන් සියයට 65ක් නියෝජනය කරන සිසුන් 3,814ක් පමණක් NVQ සහතිකය ලබා තිබුණි. තවද, සිසුන් සඳහා පාඨමාලා නොමිලයේ වුවද, සිසුන්ගෙන් සියයට 30 ක ප්‍රතිශතයක් ඉවත්ව යන බව නිරීක්ෂණය විය. එබැවින්, විවිධ අදියරවල පාඨමාලා හැර ගිය සිසුන් වෙනුවෙන් විවිධ වාරික වශයෙන් දරන ලද පිරිවැයෙන් නිපුණතා ශ්‍රම සැපයීම සඳහා ප්‍රතිලාභ ලබා ගෙන නොතිබුණි. | ඉලක්කය සපුරා ඇත. ඩීඑල්අයි 05 ට අදාළව ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දුන් මුළු මුදල මේ වන විට ලැබී ඇත. පාඨමාලා 5,863 ක් සම්පූර්ණ කර සහතිකපත් නිකුත් කර ඇති අතර ඉන් 3,814ක් NVQ සහතික ලබා ඇත. එය පාඨමාලාව සම්පූර්ණ කළ පිරිසෙන් 65%ක් පමණ වේ. ඉතිරි 35% සඳහා අදාළ ආයතන මගින් සහතික නිකුත් කර ඇත. | ඉවත්වීම අවම කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | ඩීඑල්අයි 6 (II) සාක්ෂාත් කර ගැනීම සඳහා කර්මාන්ත අංශයේ සේවය කරන සේවකයින්ගේ හැකියාවන් ඉහළ නැංවීම මගින් සේවකයින් 4,000 ක් පුහුණු කිරීම අවශ්‍ය වේ. එහෙත් ලැබී ඇති තොරතුරුවලට අනුව, 2022 දෙසැම්බර් 31 වන විට සියයට 40ක් නියෝජනය කරන සේවකයන් 1,581ක් සඳහා පමණක් රු. මිලියන 9.52 ක් වැය කර පුහුණු වැඩසටහන් පවත්වා තිබුණි. | 2022 වර්ෂය සඳහා SSDP සඳහා අයවැය ප්‍රතිපාදන ප්‍රමාද වීම හේතුවෙන් සැලසුම්ගත කර්මාන්ත සේවක පුහුණුව ආරම්භ කිරීම 2022 දෙසැම්බර් මස ආරම්භ විය. රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් කර්මාන්ත ආයෝජනය කිරීමට හෝ පුහුණුව ලබා දීම ප්‍රමුඛතාවයක් ලෙස නොසලකන ලදී. | ප්‍රමාදයකින් තොරව ණය ලබා දීම සඳහා ඩීඑල්අයි සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ඩීඑල්අයි 9 (ii) යටතේ මධ්‍ය කාලීන ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සහ වියදම් රාමුව සමඟ 2021 සිට 2030 දක්වා නව අංශික උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම 2022 දෙසැම්බර් 31 දිනට නිම කර නොතිබුණි. | 2022 දී SSDP සඳහා අයවැය ප්‍රතිපාදන ප්‍රමාද වූ බැවින් අවශ්‍ය උපදේශකයින් සහ ප්‍රවීණයන් ඔවුන්ගේ වියදමින් ලබාදීමට ආ.සං.බැ එකඟ විය.<br>මෙය ආරම්භ කිරීම ප්‍රමාද වීමට හේතු වූ අතර මේ වන විට ආ.සං.බැ උපදේශකයා විසින් පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීමේ සැසි රැසක් සිදු කර අවසන් වන අතර ඩීඑල්අයි අවශ්‍යතාවය සපුරාලන උපාය මාර්ග වාර්තාව ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සහ මූල්‍ය රාමුව සමඟ සම්පූර්ණ කර ඇත. අදාළ අරමුදල් ලබාදීම සිදු කරනු ලැබේ. | ප්‍රමාදයකින් තොරව ණය ලබා දීම සඳහා ඩීඑල්අයි සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS/QIS) පුහුණු මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 305ක තරු 3ක් සහිත ආයතන 175ක් සහ තරු 4ක් සහිත ආයතන 130ක් ලෙස 2016 වර්ෂයේ සිට 2022 වසර දක්වා DLI 02 යටතේ ස්ථාපිත කර ඇති අතර ඒසඳහා<br>රු. මිලියන 168.74ක් වැය කර තිබුණි. කෙසේවෙතත්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවලට අනුව, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු මධ්‍යස්ථාන 223ක් තත්ත්ව සහතික ලබාගෙන තිබුණද, එම සියලුම සහතිකවල වලංගු කාලය 2022 දෙසැම්බර් 31 දිනට අවසන් වී තිබුණි. තවද ආයතන 29ක් පමණක් . ලබා ගත් සහතිකය අලුත් කර ඇති අතර අලුත් කරන ලද සහතිකවල වලංගු කාලය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණි. එබැවින් 2023 වසරේ වැඩසටහන අවසන් වන තුරු පුහුණු මධ්‍යස්ථානවල ගුණාත්මක බව අඛණ්ඩව පවත්වා ගෙන ගොස් නොමැති බව ඉන් නිරීක්ෂණය විය. | තත්ත්ව කළමනාකරණ පද්ධතියට අදාළ DLI 02, 2020 වසර වන විට සාක්ෂාත් කර ගත යුතු ඉලක්කය වන්නේ TVEC ලියාපදිංචි පුහුණු මධ්‍යස්ථාන 300 ක තත්ත්ව වැඩිදියුණු කිරීමේ පද්ධති ස්ථාපිත කිරීමයි. 2020 අවසානය වන විට QIS පද්ධතිය එහි අරමුණු සාක්ෂාත් කර ගෙන ඇත. කෙසේ වෙතත්, QMS පද්ධතිය ස්ථාපිත කිරීම TVEC මගින් සිදු කරනු ලබන අතර පුහුණු මධ්‍යස්ථාන 223 ක් QMS පද්ධතිය ස්ථාපිත කර ඇත. මේවායේ වලංගු කාලය දීර්ඝ කිරීම අදාළ ආයතනවල වගකීම වන අතර ඒ සඳහා ආයතනය විසින් TVEC වෙත ඉල්ලීමක් කළ යුතුය. එවිට TVEC ආයතනය ඊට අදාළ ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා පුහුණු මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳව අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

(e) **යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම**

**(i) ජාතික තරුණ සේවා සභාවේ ඉදිකිරීම් කටයුතු**

| | | |
|---|---|---|
| මොනරාගල, දඹුල්ල සහ ලව්ලේන් පුහුණු මධ්‍යස්ථානවල ඉදිකිරීම් කටයුතු පිළිවෙළින් සියයට 70ක් සහ සියයට 65ක් අවසන් කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරුවන් විසින් නවතා දමා තිබුණු අතර ඒ වන විට වැඩසටහන මගින් රු. මිලියන 146.68ක් වැය කර තිබුණි. | අභ්‍යාසලාභීන්ට පහසුකම් සැලසීමේ අරමුණින් මෙම මධ්‍යස්ථානවල යෝජිත ඉදිකිරීම් බලාපොරොත්තු වූ පරිදි නිම කිරීමට නොහැකි වූ හෙයින්, එම මධ්‍යස්ථාන සඳහා 2023 ක්‍රියාකාරී සැලැස්ම මගින් මිලියන | ඉදිකිරීම් වල ඉතිරි වැඩ නිම කිරීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පසු විපරම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| කෙසේවෙතත්, සභාව විසින් කොන්ත්‍රාත්තු නැවත ප්‍රදානය කර නොමැති අතර ඉතිරි වැඩ 2022 දෙසැම්බර් 31 වන විට අවසන් කර නොමැති බව නිරීක්ෂණය විය. | 15ක් එනම් රු.මිලියන 5 බැගින් වෙන් කර ඇත. ඒ අනුව පන්තිකාමර 4ක වැඩ අවසන් කර මෙම සෑම ගොඩනැගිල්ලකටම විදුලිය හා ජලය සැපයීම සඳහා වියදම් ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කර ඇත. මෙම වසර අවසන් වන විට එහි කටයුතු අවසන් කිරීමට නියමිතයි. | |

**(ii) කිලිනොච්චියේ ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු**

2017 සැප්තැම්බර් 12 දින ගත් කැබිනට් තීරණයට අනුව, සිසුන් 400 දෙනෙකුට නේවාසික පහසුකම් සැලසීම සඳහා මහල් 3 කින් යුත් නව නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. මිලියන 253.8ක් වෙන් කර ඇති අතර 2020 මැයි 20 දින ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 185.61 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (අ) අවස්ථා 03කදී කොන්ත්‍රාත් කාලය 2023 ජූනි 30 දක්වා දීර්ඝ කළද, 2022 දෙසැම්බර් 31 වන විට සියයට 75ක භෞතික ප්‍රගතියක් පමණක් ලබාගෙන තිබුණි. | යෝජිත නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2021 අගෝස්තු 27 වන දින නිම කිරීමට අදහස් කර ඇත. නමුත් 2020 දී කොවිඩ් වසංගතය හේතුවෙන් වැඩබිම අවට සේවකයින් ඉතා අඩු බැවින්, ඉදිකිරීම් වල ඵලදායිතාව ඉතා පහළ මට්ටමක පැවතුනි.<br><br>කොන්ත්‍රාත්කරුගේ පෙර බිල්පත් ගෙවීම ප්‍රමාද වීම සහ විදුලිය විසන්ධි වීම සහ වෙළඳපොලේ ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල වැඩිවීම හා හිඟය හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් 26/04/2022 දිනැති 03/2022 භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන අනුව ඉදිකිරීම් නතර කරන ලදී. කොන්ත්‍රාත්කරුට හිඟ මුදල් ගෙවීමෙන් පසු නැවත වැඩ ආරම්භ කරන ලෙස ඉල්ලා සිටියද, එම අවස්ථාවේ ද්‍රව්‍යවල මිල ඉතා ඉහළ බැවින් ඔහු නැවත වැඩ ආරම්භ කිරීම ප්‍රතික්ෂේප කළේය.<br><br>එබැවින් දැනට පවතින මිල ගණන් යොදා ගනිමින් බිම් මහලේ වැඩ අවසන් කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කරන ලද අතර එය උපදේශකවරයා විසින් පරීක්ෂා කර සංශෝධන සහිතව අප වෙත ඉදිරිපත් කරන ලදී. තුන්වන දිගුව කොන්ත්‍රාත්කරු සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීමෙන් පසු ඉදිකිරීම් නැවත ආරම්භ කර 2023.06.30 වන විට අවසන් කිරීමට ලබා දෙන ලදී. | ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | |
|---|---|---|
| (ආ) ගිවිසුමේ කොන්ත්‍රාත් දත්ත 14.5 අනුව, අතුරු ගෙවීම් සහතිකයේ අවම වටිනාකම රු. මිලියන 6.5 කි. කෙසේවෙතත්, එම වටිනාකමට වඩා අඩු රු. මිලියන 18.73 ක් වටිනා අතුරු ගෙවීම් සහතික 04ක් ගෙවීම් සඳහා ඉදිරිපත් කර තිබුණි. | ගිවිසුමේ කොන්ත්‍රාත් දත්ත 14.5 අනුව අතුරු ගෙවීම්වල අවම වටිනාකම මිලියන 6.5ක් වුවද අදාළ කාලය තුළ සේවක හිඟය හේතුවෙන් ඉදිකිරීම්වල ඵලදායිතාව ඉතා පහළ මට්ටමක පැවතිණි. නියමිත වේලාවට කළ යුතු ඉදිකිරීම්වලට වටිනාකමට ළඟා වීමට නොහැකි වීම නිසා නියමිත වේලාවට කළ යුතු ඉදිකිරීම් ප්‍රමාණයට ළඟා වීමට නොහැකි විය. මූල්‍ය ප්‍රගතිය සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘතියේ අඛණ්ඩ මුදල් ප්‍රවාහය සහතික කිරීම සඳහා ලැබුණු සියලුම ගෙවීම් ගෙවීමට කටයුතු සම්පාදනය කරන ලදී. | ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) පසුව, සේවයේ නියුතු උපදේශක සමාගම විසින් ප්‍රමාණ පත්‍රය සකස් නොකර කොන්ත්‍රාත්කරු විසින් බිම් මහල සඳහා සකස් කරන ලද රු. මිලියන 120.14 සංශෝධිත ප්‍රමාණ පත්‍රය මත පදනම්ව වැඩසටහන් කාලසීමාව අවසන් වන විට ගොඩනැගිල්ලේ බිම් මහල පමණක් නිම කිරීමට රු. මිලියන 60 ක කොන්ත්‍රාත්තුවක් අතිරේකව ලබා දී තිබුණි. තවද, වැඩසටහන් කාලසීමාව අවසානයේ අනෙකුත් මහල්වල ඉතිරි වැඩ නිම කිරීමේ අවිනිශ්චිතතාවයක් පවතී. | නේවාසිකාගාර ගොඩනැගිලි ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකමට අමතරව නිපුණතා අංශයේ සංවර්ධන අංශය, කොන්ත්‍රාත්කරු සහ උපදේශකවරයා එක්ව ගත් තීරණය අනුව ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ සඳහා කොන්ත්‍රාත්කරු විසින් සකස් කරන ලද සංශෝධිත ප්‍රමාණ පත්‍රයේ රු. 120,145,430 ක් උපදේශකවරයාගේ උපදෙස් මත අමාත්‍යාංශයේ තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර එහි නිර්දේශය ලබාගෙන ඇත.<br>නේවාසිකාගාරයේ ඉතිරි මහල්වල ඉදිකිරීම්වලට පසුව ආරම්භ කරන විට, නිම කරන ලද මහල්වල දෛනික කටයුතු ශාලාවට බාධාවක් නොමැතිව පිටත ලබාගැනීමේ ක්‍රමයක් භාවිතා කරමින් ඉදිකිරීම් සඳහා ද්‍රව්‍ය සැපයීමට බලාපොරොත්තු වේ. | සංශෝධිත ප්‍රමාණ පත්‍රය අදාළ උපදේශක සමාගම විසින් සකස් කළ යුතුය. |
| (ඈ) කොන්ත්‍රාත්කරු විසින් සකස් කරන ලද සංශෝධිත ප්‍රමාණ පත්‍රයේ සඳහන් ඉහළ ව්‍යුහය අයිතමවල සිදු කරන ලද නියැදි පරීක්ෂණයට අනුව, රු. මිලියන 10.68ක් වටිනා අයිතම 10 ක් සම්බන්ධයෙන් මුල් ප්‍රමාණ පත්‍රයේ සඳහන් ප්‍රමාණය, නිම කරන ලද වැඩ ප්‍රමාණය සහ සංශෝධිත ප්‍රමාණය ඉක්මවා තිබුණි. තවද, 3G-01 සහ 3G-03 අයිතම සම්බන්ධයෙන් සිදු කරන ලද වැඩ ප්‍රමාණයම නව ගාස්තුව යටතේ පිළිවෙලින් රු. මිලියන 2.76 ක් සහ රු. මිලියන 3.31ක් ලෙස ඉල්ලා තිබුණු බව නිරීක්ෂණය විය. | විචලතාවල වටිනාකම කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් 10% ඉක්මවන්නේ නම්, එය අනුමැතිය සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේවෙතත්, මේ වන විට, ප්‍රමාණය වෙනස් කිරීම සහ අමතර වැඩ සඳහා වියදම් කළ මුදල කොන්ත්‍රාත්තු මුදලින් 10% නොඉක්මවන බව සඳහන් වේ. ප්‍රමාණ පත්‍රයේ 3G - 1 සහ 3G - 3 අයිතම ගොඩනැගිල්ලේ වහලයට අවශ්‍ය යකඩ සංරචකය වේ. IPC 13 ගෙවන විට වහලයේ ව්‍යුහය සඳහා මෙම යකඩ භාවිතා කර ඇත. එහෙත්, වහලය සම්පූර්ණයෙන්ම නිම කර නොමැති නිසා<br><br>එම සම්පූර්ණ නොකළ භාණ්ඩ සඳහා ගෙවීම සිදු කර නොමැත. එම නිසා කොන්ත්‍රාත්කරු | කොන්ත්‍රාත්කරුගේ වැඩ අධීක්ෂණය කිරීමට සහ 3G-01 සහ 3G-03 සඳහා මුල් ප්‍රමාණ පත්‍රයේ සඳහන් ගාස්තුව මත පදනම්ව ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | විසින් මෙම භාණ්ඩ දෙක සඳහාද නව මිල ගණන් සමඟ සංශෝධිත ප්‍රමාණ බිල්පත ඉදිරිපත් කර ඇත. සඳහන් කර ඇති එම අයිතම සඳහා ගෙවීම් කිරීමේදී, මේ සඳහා භාවිතා කරන ගාස්තු ව්‍යාපෘතියේ මුල් ප්‍රමාණ පත්‍රයේ සඳහන් වන බැවින්, මහජන මුදල්වල පාඩුවක් සිදු නොවේ. | |
| (ඉ) උපදේශක සමාගම අවශ්‍ය පරිදි නේවාසිකාගාරයේ මූලික සැලැස්ම සකස් කර නොතිබීම හේතුවෙන් අනුමැතියකින් තොරව ප්‍රමාණ පත්‍රයේ හි සඳහන් ප්‍රමාණයන්ට වඩා සියයට 10 සිට සියයට 780 දක්වා අයිතම 36ක් සඳහා රු.මිලියන 5.56ක අතිරේක පිරිවැයක් දරා ඇති බව අතුරු ගෙවීම් සහතික අංක 13 විගණනය කිරීමේදී නිරීක්ෂණය විය. | IPC 13 හි අයිතමවල ප්‍රමාණයන් මුල් ප්‍රමාණ පත්‍රයේ ප්‍රමාණයන් සමඟ සංසන්දනය කිරීමේදී වැඩි අඩුවීම් ඇති බව මම පිළිගනිමි. කෙසේවෙතත්, කාර්යයේ වටිනාකම මුළු කොන්ත්‍රාත්තුවෙන් 10% ඉක්මවන විට ගෙවීමට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගෙන් අනුමැතිය ලබා ගැනීමට පියවර ගනු ලැබේ. | කොන්ත්‍රාත්ක ගේ වැඩ කටයුතු අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) වර්තමානයේ මෙම පුහුණු මධ්‍යස්ථානයේ NVQ 4 සහ 5 පාඨමාලා 12ක් පමණක් අංශ 6ක් යටතේ පවත්වනු ලබන අතර 2018 වර්ෂයේ බඳවාගත් සිසුන් 304 දෙනෙකු 2022 වර්ෂය වන විට ක්‍රමයෙන් 211 දක්වා අඩුවී තිබුණි. තවද, සිසුන් 144 දෙනෙකුගේ නේවාසික පහසුකම් අවශ්‍යතා දැනට නේවාසිකාගාර 3කින් සපුරනු ලබන අතර නේවාසික පහසුකම්වල උපරිම අවශ්‍යතා ඇස්තමේන්තු කර සැලැස්මක් සකස් කළේ නම් මෙතෙක් දරන ලද මුදලින් සම්පූර්ණ ඉදිකිරීම් කටයුතු ව්‍යාපෘති කාලසීමාව තුළ නිම කිරීමට හැකියාව තිබුණි. | 2017 වර්ෂයේදී මෙම ආයතනයේ පූර්ණ කාලීන පාඨමාලා 22ක් පවත්වා ගෙන ගොස් ඇත. වසරකට සිසුන් 300-400ක් බඳවා ගන්නේ නම් සහ දීර්ඝ කාලයක් ගතවන (වසරක් හෝ ඊට වැඩි) පාඨමාලා සලකා බැලුවහොත්, වරකට සාමාන්‍යයෙන් පිරිමි/කාන්තා 600ක් පමණ සිටිනු ඇතැයි උපකල්පනය කළ හැකිය. ඒ අනුව මෙම ගොඩනැගිල්ල සාමාන්‍යයෙන් පිරිමි සිසුන් 400කට පමණ පහසුකම් සැලසෙන පරිදි නිර්මාණය කර ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ ඉල්ලීම පරිදි මොරටුව විශ්වවිද්‍යාලය විසින් සකස් කරන ලද IEE වාර්තාවේ මේ බව සඳහන් කර ඇත. | බඳවා ගැනීම් ක්‍රමයෙන් අඩුවීම කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර මෙම තත්ත්වය යථා තත්ත්වයට පත්වීම සඳහා අදාළ ආයතනය සඳහා නව පාඨමාලා හඳුන්වා දිය යුතුය. |

**(iii) වෘත්තීය පුහුණු අධිකාරියේ ඉදිකිරීම් කටයුතු**

| | | |
|---|---|---|
| (අ) උපදේශකවරයකු නොමැතිකම හේතුවෙන් කරෙයිනගර් හෝටල් පාසලේ සූපශාස්ත්‍ර පාඨමාලාව ආරම්භ කිරීම සඳහා 2017 වර්ෂයේදී ප්‍රසම්පාදනය කරන ලද රු. මිලියන 10.47ක් වටිනා පුහුණු උපකරණ වර්ෂ 5ක නිශ්කාර්ය කාලයකට පසු 2022 වර්ෂයේදී ආරම්භ කර ඇත. කෙසේවෙතත්, 2022 සහ 2023 දී පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව පිළිවෙළින් 35 සහ 20 කි. | එම මධ්‍යස්ථානයේ ඉහත උපකරණ කට්ටලය අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් පියවර කිහිපයක් ගෙන ඇති අතර 2022 වසරේ සිට උපදේශකයෙකු බඳවාගෙන එම මධ්‍යස්ථානයේ පාඨමාලාව ආරම්භ කිරීමට කටයුතු යොදා ඇති අතර දැනට එම පාඨමාලාව අඩු මට්ටමින් ක්‍රියාත්මක වේ. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව උපකරණ සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2016 වර්ෂයේදී පොතුවිල්හි සූපවේදීන්ගේ පාඨමාලාව සඳහා රු. මිලියන 4.47 වටිනා පුහුණු උපකරණ මිලදීගෙන තිබුණි. කෙසේවෙතත්, උපදේශකවරුන් නොමැතිකම හේතුවෙන් අදාළ පාඨමාලාව විගණනිත දිනය දක්වා ආරම්භ කර නොතිබුණි. එබැවින්, මෙම උපකරණ නිශ්කාර්යව පැවති අතර වගකීම් කාලයද අවසන් වී ඇත. | පොතුවිල් හෝටල් පාසල ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා සූපශාස්ත්‍ර පාඨමාලාව ආරම්භ කිරීමට උපකරණ මිලදී ගෙන ඇති අතර පාඨමාලාව ඉගැන්වීම සඳහා සුදුසුකම්ලත් උපදේශකයකු බඳවා ගැනීමට නොහැකි වූ බවත් පිළිගනී. මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ සූපවේදී NVQ Level 4 පාඨමාලාවක් පැවැත්වීම සඳහා අවම වශයෙන් සූපවේදී NVQ 4 මට්ටමේ සුදුසුකම් සහ වසරක පළපුරුද්දක් ඇති සුදුසුකම්ලත් දෙමළ මාධ්‍ය උපදේශකවරයකු බඳවා ගැනීමට නොහැකිවීමයි.<br>එසේම සතියේ දිනවල අර්ධකාලීන පාඨමාලාවක් සහ අර්ධකාලීන පාඨමාලාවක් ආරම්භ කිරීමට VTA/TRD/AD/TI/පුහුණු සැලැස්ම 2023 අංකය දරන 2023.03.20 දිනැති ලිපිය හරහා සියලුම දිස්ත්‍රික්කවලට සුදුසුකම්ලත් බාහිර උපදේශකයකු බඳවා ගැනීමටත් අවශ්‍ය කටයුතු කිරීමටත් ඉදිරියේදී සිදුකරනු ලැබේ. | වැඩසටහනේ කළමනාකරණය විසින් උපකරණ ලබාදීමට පෙර පුහුණු ආයතනවල පහසුකම් හොඳින් තක්සේරු කළ යුතුය. |
| (ඇ) සිසුන් සඳහා පුහුණු අවස්ථා ලබා දීම සඳහා අහංගම හෝටල් පාසල හෝටලයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීමට වැඩසටහන විසින් එකතුව රු. මිලියන 162.18ක් වැය කර ඇත. කෙසේවෙතත්, එවැනි පුහුණු වැඩසටහන් 2023 මාර්තු 15 වැනි දිනවන විටත් ආරම්භ කර නොතිබුණි. | අහංගම හෝටල් පාසලේ අභ්‍යාසලාභීන්ගේ පුහුණුව විගණනයෙන් පෙන්වා දෙන පරිදි අවසන් කර නොමැති අතර දැනට මෙම හෝටලය ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සමඟ එක්ව වැඩිදුර පුහුණු හෝටල් පාසලක් බවට පත් කිරීමට අප සංවිධානය කටයුතු කරමින් සිටී. | වැඩසටහනනේ කළමනාකරණය වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පමණක් අරමුදල් යෙදවිය යුතුය. |
| (ඈ) අම්පාර සහ යාපනය දිස්ත්‍රික්කවල සංචාරකයින්ට ලබාදීමේ අරමුණින් වෘත්තීය පුහුණු අධිකාරියේ අරමුණුවලට පටහැනිව ඉදිකරන ලද හෝටල් කාමර 22 කට ලබා දෙන ලද රු. මිලියන 91.03 ක් සහ රු මිලියන 6.10ක් වටිනා ගෘහභාණ්ඩ 2017 වසරේ සිට අක්‍රියව පැවතුණි.. | මෙම කාමර නඩත්තු කිරීමේ සහ පවත්වාගෙන යාමේ කළමනාකරණයේ අඩුපාඩුවක් හේතුවෙන් මෙම හෝටල් කාමර ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගෙන නොමැති අතර, මෙම හෝටල් කාමර ඵලදායි ලෙස භාවිත කිරීම සඳහා පෞද්ගලික අංශය සමඟ එක්ව වැඩසටහන් දියත් කිරීමට කටයුතු යොදා ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව හෝටල් කාමර ප්‍රයෝජනවත් අයුරින් උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) කුච්චිවේලි හෝටල් පාසලේ ආධුනිකයන් 52 දෙනෙකුට නවාතැන් ගැනීම සඳහා අංග සම්පූර්ණ කාමර 12කින් සමන්විත දෙමහල් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් රු. මිලියන 140.21ක් වැයකර 2017දී ඉදිකර ඇත. කෙසේවෙතත්, ස්ථිර ජල සැපයුමක් ගොඩනැගිල්ලට ලබා ගත නොහැකිවීම හේතුවෙන් නේවාසිකාගාරය 2023 මාර්තු 15 දක්වා අක්‍රියව පැවතුණි. | කුච්චවේලි හෝටල් පාසල ආරම්භ කරන අවස්ථාවේදී ස්ථිර ජල සැපයුමක් නොමැති බව හඳුනාගෙන ජල සම්පාදන මණ්ඩලය මගින් ස්ථිර ජල සැපයුමක් ලබාදෙන තුරු එම මධ්‍යස්ථානයට අවශ්‍ය ජල පහසුකම් බවුසර් මගින් ලබාදෙන බවට ඇතිකරගත් එකඟතාව මත මෙම මධ්‍යස්ථානය ආරම්භ කර ඇත.. එමෙන්ම උතුරු නැඟෙනහිර යුද වාතාවරණය අවසානයේ එම ප්‍රදේශවල ආධුනික පුහුණුව සඳහා ඇති ඉල්ලුම සලකා | වැඩසටහනේ කළමනාකරණය ප්‍රයෝජනවත් ආකාරයෙන් අරමුදල භාවිතා කළ යුතුය. |

| | | |
|---|---|---|
| | බලා මෙම මධ්‍යස්ථානය ආරම්භ කළද සුදුසුකම්ලත් උපදේශකවරයකු බඳවාගෙන ගැනීමේ අපහසුතාවය හේතුවෙන් මෙම තත්ත්වය ඇති විය. මෙම සම්පත් වඩාත් ඵලදායී ලෙස භාවිත කිරීම සඳහා කළමනාකරණය දැනටමත් පෞද්ගලික අංශය සමඟ කටයුතු කරනු ලැබේ. | |

**(iv) බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය**

| | | |
|---|---|---|
| (අ) ආගන්තුක සත්කාර කළමනාකරණ රසායනාගාරයේ නාන කාමරයක් ඉදිකිරීම සඳහා 2015 අගෝස්තු 24 දින ලබා දුන් රු. 464,400ක් වටිනා නානකාමර උපාංග සහ රු. 772,133 වටිනා පරිගණක උපාංග බටංගල විශ්වවිද්‍යාල විද්‍යාලයේ පරිගණක විද්‍යාගාරයේ 2023 මැයි මාසයේ විගණන දිනය වන විටත් නිෂ්ක්‍රීයව තිබුණි. | ආගන්තුක සත්කාර කළමනාකරණ රසායනාගාරය පුළුල් කිරීම සඳහා 2023 අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර එහි ප්‍රසම්පාදනය දැනටමත් ආරම්භ කර ඇත. | 2015 දී උපකරණ ලබාදී ඇති බැවින් එම කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) විගණනයට ලබා දී ඇති ඉදිකිරීම් පිළිබඳ තොරතුරු අනුව, වැඩසටහන මගින් රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතන 07ක් පිහිටුවීම සඳහා රු. මිලියන 954.1ක් වැය කර තිබුණි. විශ්වවිද්‍යාල විද්‍යායතන 05ක් පිහිටුවීම සඳහා ගැසට් නිවේදනයක් නිකුත් කළද කටුබැද්ද සහ බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතන පිහිටුවීමට අදාළ කිසිදු නීතිමය ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ විශ්වවිද්‍යාල විද්‍යායතන 03ක් පිහිටුවා තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටද මෙම විශ්ව විද්‍යාල විද්‍යායතන මෙහෙයුම් මට්ටමේ නොපැවතුණි. | අංක 13/0042/539/001 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව, 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය සඳහා විශ්වවිද්‍යාල විද්‍යායතන 25ක් ඉදිකිරීමට 2013 පෙබරවාරි 01 වැනි දින කැබිනට් අනුමැතිය ලබා දී ඇත.<br>ඒ අනුව අමාත්‍යාංශය සතු ඉඩම්වල වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල 5ක් ඉදිකිරීම ආරම්භ ඇත. ඉන් පසුව බටංගල සහ කටුබැද්ද වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල ඉදිකිරීම ද ආරම්භ විය. එය අවසන් වූ පසු බටංගල පමණක් විශ්වවිද්‍යාල විද්‍යායතනයක් ලෙස භාවිත විය. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ සිසුන් සඳහා ඔවුන්ගේ පාඨමාලා පැවැත්වීම සඳහා CGTTI හි කොටසක් ලෙස කටුබැද්දේ ඉදිකරන ලද අනෙකුත් ගොඩනැගිල්ල භාවිත කිරීමට ආරම්භ කර ඇත.<br><br>රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල 03ක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර ඉන් එකක් ජයවර්ධනපුර රෝහලේ ස්ථාපිත කර තවමත් ක්‍රියාත්මක වේ. එකක් මඩකලපුවේ හා අනෙක රත්මලාන ACTA ආයතනයෙත් යෝජනා කළද ඒ සඳහා මුදල් ආයෝජනය කර නොමැත. | ඉතිරි විශ්වවිද්‍යාල විද්‍යායතනවල නීතිමය තත්ත්වය ලබාගැනීමට පියවර ගත යුතුය. |

(ඇ) වෘත්තීය පුහුණු ආයතනවලින් ලැබෙන නිපුණතා සැපයීම සහ කර්මාන්තවලින් ඉල්ලා සිටින කුසලතා අතර පරතරය පියවා නිපුණ හා ඉහළ නිපුණතා ඇති ශ්‍රම බලකායෙන් කුසලතා පරතරය පිරවීමේ අරමුණින් 2022 වසර අවසානයේ දී කර්මාන්ත අංශ සභා 04 ක් පිහිටුවන ලද අතර 2022 අවසන් වන විට අදාළ සභා ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 140.9 ක් වැය කර තිබුණි. පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | ලැබී ඇති ප්‍රගති වාර්තාවට අනුව, ඉදිකිරීම්, නිෂ්පාදන සහ ඉංජිනේරු සේවා කර්මාන්ත අංශ නිපුණතා සභා සහ අලුතින් පිහිටුවන ලද කෘෂිකාර්මික කර්මාන්ත අංශයේ නිපුණතා සභා 2022 වර්ෂය තුළ එම සභා පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කිසිදු කාර්යයක් කර නොතිබුණි. | විවිධ ව්‍යාපෘති මුලපිරීම්වලදී නිපුණතා අවශ්‍යතා පිළිබඳ තොරතුරු TVET අංශය වෙත බෙදා හැරීම සම්බන්ධයෙන් බොහෝ කර්මාන්ත ක්‍රියාකාරකම් සිදු කර ඇත. තවද, NCS/විෂයමාලා සංවර්ධනය සඳහා ක්‍රියාකාරී මැදිහත්වීමක් සිදුවී ඇත.<br>කෘෂිකාර්මික සභාව සැලසුම් කිරීමේ සහ ස්ථාපිත කිරීමේ අදියරේ පැවති අතර 2023 වසරේ සිට කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. 2022 සඳහා අයවැය ප්‍රතිපාදන ප්‍රමාදය සහ 2022 වසරේ අවසාන මාසවල ප්‍රතිපාදනවල සීමාවීම සභාවල ක්‍රියාකාරිත්වය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන ලදි. නිෂ්පාදන හා ඉදිකිරීම් කළමනාකරුවන් දෙදෙනෙකු ඉල්ලා අස් වූ අතර ඉහත හේතුව නිසා නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම ප්‍රමාද විය. SSDP වෙත අනුමත අයවැය නොමැති නිසා අඩු ප්‍රගතියක් ඇති විය. | එවැනි සභා පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මහ පෙන්වීමට කටයුතු කළ යුතුය. |
| (ii) | තොරතුරු සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත අංශයේ නිපුණතා සභාව වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුව අවසන් කළ සිසුන් ලියාපදිංචි කිරීම සඳහා සහ කර්මාන්තකරුවන්ට 'සේවා ලබා ගැනීම සඳහා සහ තොරතුරු සහ සන්නිවේදනය ක්ෂේත්‍රයේ නියැලී සිටින සිසුන් සඳහා වැඩමුළු පැවැත්වීමට ජංගම යෙදුමක් නිර්මාණය කිරීම පමණක් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර ඇත. | මේවන විට ව්‍යාපෘතිය අවසන් කර ඇති අතර විශාල සේවාදායක කණ්ඩායමක් අතර සේවා සපයන්නන් සංඛ්‍යාව වැඩි කිරීමේ ප්‍රයත්නයන් සභාව යෙදෙමින් සිටී. සාමාන්‍ය ජනතාවට සේවය කරන අතරම යෙදුම හරහා තම සේවාවන් අලෙවි කිරීමට NVQ සහතික හිමියන්ට බොහෝ වාසි පවතී. ඒ අතරම, එය ඔවුන්ගේ ස්වයං තිරසාරභාවය සඳහා ආදායමක් උපයා ගැනීමට සභාවට ඉඩ සැලසෙයි. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ තොරතුරු රැස් කිරීම ද ප්‍රයෝජනවත් වනු ඇත. | එවැනි සභා පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මහ පෙන්වීමට කටයුතු කළ යුතුය. |
| (iii) | සංචාරක කර්මාන්ත අංශයේ නිපුණතා සභා විසින් සමාලෝචිත වර්ෂය තුළ හෝටල් සහ සංචාරක කර්මාන්ත අංශය පිළිබඳව කාන්තාවන් සහ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පමණක් | ආර්ථික අර්බුදකාරී තත්ත්වයන් හේතුවෙන් සංචාරක කර්මාන්තයේ පවතින බාධාකාරී තත්ත්වයන් යටතේ පවා අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ සැසියක් පැවැත්වූ හෝම් ස්ටේ සංකල්පය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | එවැනි සභා පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මහ පෙන්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පවත්වා තිබුණි. | කර්මාන්තයට මෙන්ම සභාවටද ප්‍රතිලාභ ගෙන දී ඇත. | |
| (iv) | මෙම සභා තාක්ෂණික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයට නිසියාකාරව ඇතුළත් නොවීම, සභා රජයේ මුදලින් ක්‍රියාත්මක වීම, ස්වයං ආදායම් උත්පාදනය සඳහා ප්‍රමාණවත් පියවර නොගැනීම, ස්ථිර කාර්ය මණ්ඩලය සහ පරිපාලනය නොමැතිවීම, සභා සඳහා නීතිමය තත්ත්වය නොමැතිවීම, නිසි අධීක්ෂණ යාන්ත්‍රණයක් නොමැතිවීම හේතුවෙන් එම අපේක්ෂා කළ අරමුණු ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. | සභාවල අතීත මෙහෙයුම් පිළිබඳව පුළුල් සමාලෝචනයක් සිදු කර ඇති අතර වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ඇති අතර සුදුසු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් සභා හොඳ කාර්ය සාධනයක් කරා මෙහෙයවනු ඇත. සභාවල අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සහ ඒවායේ තිරසාරභාවය සහතික කිරීම සඳහා ස්වයං ආදායම් උත්පාදනය කිරීමට, අවශ්‍ය පරිදි කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සහ අවශ්‍ය නෛතික තත්ත්වය ලබා දීමට උපාය මාර්ගික සැලැස්මක් සකස් කර ඇත. අංශික උපාය මාර්ග සංවර්ධන උපදේශකයින් විසින් ලේඛනය සමාලෝචනය කර ඇති අතර ලේකම්වරයාගේ / නායකත්වයේ අවසාන එකඟතාවයෙන් පසුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. | එවැනි සභා පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මඟ පෙන්වීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ලැබී තිබුණු තොරතුරුවලට අනුව, 2018 සිට 2021 දක්වා කාලය තුළ NCS/විෂයමාලා සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන රු. මිලියන 30.27 ක් වැය කර ඇත. කෙසේ වෙතත්, අලුතින් සංවර්ධනය කරන ලද පාඨමාලා 16 ක් සහ සංශෝධිත පාඨමාලා 11 ක් සඳහා සිසුන්ගේ සහභාගීත්වය ඉතා පහළ මට්ටමක පැවතුනි. ඉන් 2022 දක්වා කිසිදු සහතිකයක් නිකුත් කර නොමැති පාඨමාලා 08ක් විය. | ඉහත සඳහන් NSC ට අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත. | වෙළෙඳපොළට ගැලපෙන විෂයමාලා සකස් කිරීමට කටයුතු කළ යුතුයි. |

## 3.2 පරිබාහිර වියදම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| නිපුණතා අංශික සංවර්ධන වැඩසටහන 2014 දී ආරම්භ කර 2021 ජූනි 30 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, වැඩසටහන් කාලය 2022 ජූනි 30 දක්වා දෙවතාවකින් දීර්ඝ කර ඇති අතර, නියමිත වේලාවට ණය ලබා දීමේ ප්‍රමාදය හේතුවෙන් ණය නියෝජිතායතනය අතිරේක ණය අංක 3651 සඳහා එ.ජ.ඩො 3,823ක බැඳීම් ගාස්තු අයකර ගෙන තිබුණි. | ණය ගිවිසුමට අනුව, ණය ගිවිසුමේ දින සිට දින 60 කට පසුව අදාළ බැඳීම් ගාස්තු බලාත්මක වේ. ඒ අනුව, ණය නියෝජිතායතනයට කැපවීමේ ගාස්තු අයකරගත හැකි වේ. | අනවශ්‍ය වියදම් මඟහරවා ගැනීම සඳහා අකාර්යක්ෂමතාව අවම කර නියමිත වේලාවට ණය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 අභ්‍යන්තර පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අපේක්ෂිත ඩීඑල්අයි ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩසටහන් කාලසීමාව දීර්ඝ කරන ලද අතර, මෙම කටයුතු සඳහා සහ අනෙකුත් අඛණ්ඩ වැඩ කටයුතු සඳහා පමණක් අයවැය වෙන් කරන ලදී. මෙහෙයුම් කමිටු රැස්වීමක් පැවැත්වීමේ අරමුණ සහ අවශ්‍යතාවය වන්නේ ක්‍රියාකාරකම් සඳහා මෙහෙයුම් කමිටු අනුමැතිය ලබා ගැනීමයි. මෙම සන්දර්භය තුළ FLM ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය මෙහෙයුම් කමිටු අනුමැතිය දැනටමත් ගෙන ඇති බැවින් එවැනි අවශ්‍යතාවයක් නොතිබුණි. | මුදල් රෙගුලාසි 133 අනුව අභ්‍යන්තර විගණන අංශය මගින් වැඩසටහනේ ක්‍රියාකාරකම් විගණනය කිරීමට කටයුතු කළ යුතුය. |